# පළමුවැනි කොටස

# බර සහ මිණුම්

## පරිවර්තන සාධක

**බ්‍රිතාන්‍ය ඒකක සඳහා මෙට්‍රික් ඒකක**

| | | |
|---|---|---|
| අක්කර 1 | = | හෙක්ටෙයාර් (හෙ.) 0·405 |
| රාත්තල් 1 | = | කිලෝග්‍රෑම් (කි.ග්‍රෑ.) 0·454 |
| දිගු ටොන් 1 (රා. 2240) | = | මෙට්‍රික් ටොන් (මෙ. ටො.) 1·016 |
| හොණ්ඩර 1 | = | කි. ග්‍රෑ. 50·802 |
| සැතපුම් 1 | = | කිලෝ මීටර් (කි. මී.) 1·609 |
| දිගු ටොන් සැතපුම් 1 | = | මෙ. ටො. කි. මී. 1·635 |
| අක්කරයට රාත්තල් 1 | = | හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 1·121 |
| අක්කරයට හොණ්ඩර 1 | = | හෙක්ටයාරයට කි. ග්‍රෑ. 125·536 |
| පයින්ට් 1 | = | ලීටර් 0·57 |
| එ. රා. ගැලුම් 1 | = | ලීටර් 4·55 |

**මෙට්‍රික් ඒකක සඳහා බ්‍රිතාන්‍ය ඒකක**

| | | |
|---|---|---|
| හෙක්ටයාර් 1 | = | අක්කර 2·471 |
| කිලෝග්‍රෑම් 1 | = | රාත්තල් 2·205 |
| මෙට්‍රික් ටොන් 1 (කි. ග්‍රෑ. 1000) | = | දිගු ටොන් 0·984 |
| මීටර් 1 | = | අඩි 3·281 |
| කිලෝ මීටර් 1 | = | සැතපුම් 0·621 |
| මෙට්‍රික් ටොන් කිලෝ මීටර් 1 | = | දිගු ටොන් සැතපුම් 0·612 |
| ලීටර් 1 | = | පයින්ට් 1·76 = එ. රා. ගැලුම් 0·219 |
| හෙ. 1 ට කි. ග්‍රෑ. 1 | = | අක්කරයට රාත්තල් 0·892 |

**වී/සහල් පරිවර්තන**

| | | |
|---|---|---|
| වී බුසල් 1 (රාත්තල් 46) | = | කි. ග්‍රෑ. 20·87 |
| වී මෙට්‍රික් ටොන් 1 | = | වී බුසල් 47·92 |
| | = | සහල් මෙට්‍රික් ටොන් 0·7 |
| සහල් මෙට්‍රික් ටොන් 1 | = | වී බුසල් 68·46 |
| | = | වී මෙට්‍රික් ටොන් 1·43 |
| අක්කරයට වී බුසල් 1 | = | හෙක්ටයාරයට වී කි. ග්‍රෑ. 51·55 |

# 1980 ආර්ථික ප්‍රගතිය, ගැටළු සහ ප්‍රතිපත්ති

## දළ ජාතික නිෂ්පාදිතය සහ වියදම

1980 වසරේදී ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය (ද. ජා. නි.) ස්ථාවර සාධක වියදම් මිල (1970) අනුව බලන විට සියයට 5·5 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙම වර්ධන අනුපාතිකය 1978 වර්ෂයේදී පැවති සියයට 8·2 හා 1979 පැවති සියයට 6·2 යන වර්ධන අනුපාතිකයනට වඩා අඩු මට්ටමකි. 1980 වර්ධන අනුපාතිකය සාර්ව ආර්ථික ප්‍රක්ෂෂපණයෙහි අනුපාතිකය වූ සියයට 6 ට වඩා අඩුවිය. 1980 ආර්ථික වර්ධන වේගය අඩු වීයාම ප්‍රධාන වශයෙන්ම වැවිලි කෘෂිකාර්මික අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වය නිසා සිදු වූවකි. නිමැවුම කර්මාන්ත හා තැනීම් කටයුතු අංශයන්හිද පහළ මට්ටමක වර්ධනයක් වාර්තා ගතවී තිබුණි. එහෙත් වෙළඳම, ප්‍රවාහනය හා අනෙකුත් සේවා යන අංශයන් තව දුරටත් ඉහළ වර්ධනයක් පෙන්නුම් කරන අංශයන් හැටියට පැවතියේය.

දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක වියදම් මිල අනුව රුපියල් දශ ලක්ෂ 61,807 ක් ලෙසද, ස්ථාවර (1970) සාධක වියදම් මිල අනුව රුපියල් දශ ලක්ෂ 19,405 ක් ලෙසද ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව මෙම ඇස්තමේන්තුවල ගම්‍ය මිල අවපාතනය සියයට 18 කින් වැඩිවී ඇත. 1980 ජනගහණය සියයට 1·8 කින් වැඩි වී ඇත. මෙම ජනගහණ වර්ධනය හා ගැලපූ විට ඒක පුද්ගල මූර්ත ආදයම වැඩිවී ඇත්තේ සියයට 3·7 කිනි. 1978 හා 1979 වසරයන්හි ඒක පුද්ගල වර්ධන අනුපාතිකයන් පිළිවෙලින් සියයට 6·3 ක් හා සියයට 4·2 ක්ව තිබුණි. පවත්නා මිළ ගණන් අනුව 1980 ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය රුපියල් 4,194 ක් හෙවත් ඇමෙරිකානු ඩොලර් 254 කි.

**1 · 1 සංඛ්‍යා සටහන**

**ජාතික ආදයම් පිළිබඳ සංඛ්‍යා 1978 – 1980***

| ශීර්ෂය | වටිනාකම (රු. දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය (සියයට) | | |
|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980 | 1978 | 1979 | 1980 |
| 1· පවත්නා සාධක වියදම් මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය .. | 40,479 | 49,782 | 62,246 | 16·7 | 23·0 | 25·0 |
| 2· ස්ථාවර (1970) සාධක වියදම් මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය .. | 17,401 | 18,501 | 19,575 | 8·2 | 6·3 | 5·8 |
| 3· පවත්නා සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය .. | 40,242 | 49,542 | 61,807 | 16·9 | 23·1 | 24·8 |
| 4· ස්ථාවර (1970) සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය .. | 17,311 | 18,389 | 19,405 | 8·2 | 6·2 | 5·5 |
| 5· මැදි වසර ජනගහණය (දශ ලක්ෂ) .. | 14·2 | 14·5 | 14·7 | 1·9 | 2·0 | 1·8 |
| 6· ඒකපුද්ගල දළ ජාතික නිෂ්පාදිතය (රුපි) .. | | | | | | |
| (අ) පවත්නා මිළ අනුව .. | 2,836 | 3,424 | 4,194 | 14·8 | 20·7 | 22·5 |
| (ආ) ස්ථාවර මිළ අනුව .. | 1,220 | 1,271 | 1,317 | 6·3 | 4·2 | 3·7 |

* තාවකාලික ඇස්තමේන්තු.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1980 වසරේදී පහළ මට්ටමක වර්ධන අනුපාතිකයක් වාර්තා ගතවූ අතර, ඉදිරියේදී යහපත් වාතාවරණයක් ඇති වීමට තුඩු දිය හැකි යම් යම් සාධක කීපයක්ද මේ අතර දැකිය හැකිය. අයහපත් කාලගුණ තත්ත්වයක් සෑහෙන දුරට බලපෑම නිසා වැවිලි කෘෂිකර්මාන්ත අංශය තුළ පැවති දුර්වල ක්‍රියාකාරිත්වය 1980 ආර්ථික වර්ධන වේගය අඩුවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත. වැවිලි කෘෂි නිෂ්පාදිත සැකසීම, නිමැවුම් කර්මාන්ත අංශයෙහි වැදගත් කොටසක් නිසා ඉහත කී තත්ත්වය නිමැවුම් කර්මාන්ත කෙරෙහිද අහිතකර ලෙස බලපා ඇත. මේ හැර අනෙකුත් සැම අංශයකම සතුටුදායක වර්ධන අනුපාතිකයන් දක්නට ලැබේ.

පසුගිය වසර තුළ රුපියල් කෝටි 2,400 කටත් වඩා වැඩි ප්‍රමාණයකින් ආයෝජනයන්හි විශාල වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය 1979 වර්ෂයට වඩා සියයට 81 ක වැඩි වීමකි. මෙහිදී ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය, ප්‍රධාන වශයෙන් යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන උප-කරණ ගෙන්වීම සැළකිය යුතු අන්දමින් වැඩි වී ඇත. 1980 වසරේදී මෙවැනි විශාල ප්‍රාග්ධන වියදම් වැඩිවීමකින් පෙන්නුම් කෙරෙන්නේ ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය වෙමින් පැවති බවය. ප්‍රාග්ධන තොගයෙහි මෙම වැඩි වීම නිමැවුම් කර්මාන්ත, තැනීම් කටයුතු හා ප්‍රවාහනය යන මූලික අංශයන් තුළ සිදු වීම වැදගත් කරුණකි. එසේම සේවා අහිසි ප්‍රාග්ධන උපකරණ වෙනුවට නව ප්‍රාග්ධන උපකරණ ප්‍රතිසම්පාදනයත් මෙම ආයෝජනයේ විශාල වැඩි වීමෙහි පිළිබිඹු වේ. මේ අනුව මූලික ආර්ථික අංශයන්හි කාර්යක්ෂමතාව හා ඵලදායිතාව අනාගතයේදී වැඩි දියුණු වීමට ඉඩ කඩ ඇත.

1980 දී කෘෂිකාර්මික අංශයෙහි නිමැවුම සියයට 3·1 කින් වර්ධනය වී තිබේ. මෙය මුළුමනින්ම දේශීය කෘෂි කර්මාන්තයේ සිදු වූ සියයට 7·5 ක වර්ධනයෙහි ප්‍රතිඵලයකි. ප්‍රධාන වැවිලි බෝග තුනෙහි නිෂ්පාදනය පහළ වැටීම හේතුවෙන් වැවිලි කෘෂිකර්මාන්ත අංශයේ වර්ධනය සියයට 10·1 කින් පහළ බැස ඇත. තේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 191 දක්වා සියයට 7 කින්ද, රබර් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 133 දක්වා සියයට 13 කින්ද, පොල් ගෙඩි දශ ලක්ෂ 2,026 දක්වා සියයට 15 කින්ද පහළ බැස ඇත. වැවිලි බෝග සඳහා අයහපත් කාලගුණ තත්වය මූලික වශයෙන් බලපෑවද එකී කරුණ පමණක් මෙම අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑවයි කිව නොහැකිය. කෙසේ වුවද දේශීය කෘෂිකාර්මික අංශයෙහි විශේෂයෙන් වී නිෂ්පාදනයෙහි පසුගිය වසර හා සළකා බලන කල කැපී පෙනෙන වර්ධනයක් දක්නට ඇත. යල හා මහ දෙකන්නෙහිම නිෂ්පාදනය මෙ. ටො. දශ ලක්ෂ 2·13 ක් බව ගණනය කර ඇත. එය 1979 වසර හා සසඳන කල සියයට 11 ක වැඩිවීමකි. 1980 දී අතිරේක ආහාර බෝග, පලතුරු හා එළවළු නිෂ්පාදනය සියයට 5 කින් පමණ වැඩි වූ අතර, වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තයෙහිද සැළකිය යුතු වැඩි වීම් වාර්තා ගත වී ඇත (1·2 සංඛ්‍යා සටහන බලන්න).

**1 · 2 සංඛ්‍යා සටහන**

**ස්ථාවර (1970) සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය**

| අංශය | වටිනාකම (රු. දශ ලක්ෂ) | | | | | ඉකුත් වසරට වඩා වූ වෙනසෙහි ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1970 | 1977 | 1978* | 1979* | 1980* | 1978 | 1979 | 1980 |
| 1· කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය .. | 3,732 | 4,299 | 4,532 | 4,622 | 4,766 | 5·4 | 2·0 | 3·1 |
| 2· නිමැවුම් කර්මාන්ත, කැනීම් සහ උපයෝජන සේවා .. | 2,393 | 3,003 | 3,318 | 3,501 | 3,574 | 10·5 | 5·5 | 2·1 |
| 3· තැනීම් කටයුතු .. | 744 | 619 | 794 | 960 | 1,066 | 28·3 | 20·9 | 11·0 |
| 4· වෙළඳාම, ප්‍රවාහණය, සහ අනෙකුත් සේවා | 6,318 | 8,157 | 8,757 | 9,418 | 10,169 | 7·4 | 7·5 | 8·0 |
| 5· දළ දේශීය නිෂ්පාදිතය .. | 13,187 | 16,078 | 17,401 | 18,501 | 19,575 | 8·2 | 6·3 | 5·8 |
| 6· විදේශයන්ගෙන් වූ ශුද්ධ සාධක ආදයම .. | – 220 | – 79 | – 90 | – 112 | – 170 | — | — | — |
| 7· දළ ජාතික නිෂ්පාදිතය .. | 12,967 | 15,999 | 17,311 | 18,389 | 19,405 | 8·2 | 6·2 | 5·5 |

*තාවකාලික ඇස්තමේන්තු


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF ... SRI LANKA



# දළ ජාතික නිෂ්පාදිතය


සාධක වියදම් මිළ අනුව




ශ්‍රී ලංකා මහ බැංකුව

# කාර්මික සම්භවය අනුව දළ ජාතික නිෂ්පාදිතය

ස්ථාවර (1970) සාධක වියදම් මිල අනුව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1980 දී නිමැවුම් කර්මාන්ත, පතල් හා කැනීම් කටයුතු සහ උපයෝජන සේවා යන අංශයන් වර්ධනය වී ඇත්තේ සියයට 2·1 කින් පමණි. 1979 දී ඒවායේ වර්ධනය සියයට 5·5 ක් විය.

මෙයට ප්‍රධාන වශයෙන්ම බලපා ඇත්තේ නිමැවුම් කර්මාන්ත අංශයේ පැවති සියයට 0·8 ක සුළු වැඩි වීමයි. එම තත්වය වැවිලි භෝගයන්හි සැකසුම් වල මූර්ත එකතු කළ වටිනාකම සියයට 10 කින් අඩුවීම නිසා සිදු වූවකි. පසුගිය වසරේ සියයට 4 වැඩිවීම හා සංසන්දනය කර බලන කල කර්මාන්ත නිෂ්පාදනයන්හි නිමැවුම 1980 දී සියයට 6 කින් වර්ධනය වී තිබේ. කර්මාන්ත නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අප්‍රේල් සිට ජූනි මාසය දක්වා තිබූ විදුලි බලය කපා හැරීම් අයහපත් ආකාරයෙන් බලපාන ලදී.. කෙසේ වුවද කර්මාන්ත ශාලාවන්හි වැඩ මුර වෙනස් කිරීමෙන් හා විදුලි බල උත්පාදන යන්ත්‍ර මගින් අතිරේක බලය ලබා ගැනීම මගින් නිෂ්පාදනයට ඇතිවූ බලපෑම් බොහෝදුරට මගහරවා ගැනීමට හැකි විණ. ඇත්තෙන්ම කර්මාන්ත සඳහා වූ විදුලි බල අලෙවිය මෙම වසරේදී අඩු වූයේ සියයට 2 කින් පමණකි. කාර්මික දෝෂ නිසා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය දෙමසක් වසා දැමීමද රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම කෙරෙහිද බල පෑ තවත් කරුණකි. 1979 වසරෙහි සියයට 3 ක් වූ රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිමැවුම 1980 දී සියයට 6 කින් වර්ධනය වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිමැවුම්හි සිදු වූ විශාල වැඩි වීමයි. නමුත් සිමෙන්ති, රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සම්භාණ්ඩ සහ සකස් කළ ලෝහ නිෂ්පාදනයන්හි නිමැවුම් අඩු වීමක් දක්නට ඇත. පුද්ගලික අංශයේ කර්මාන්තවල මෙම වසර තුළදී සියයට 4·5 ක වර්ධනයක් වාර්තා වී තිබේ.

පතල් හා කැනීම් අංශයේ නිමැවුම සියයට 5 කින් වැඩි වී ඇත. මේ අංශයේ වර්ධනයට බල පෑ ප්‍රධාන සාධකය වී ඇත්තේ මැණික් ගැරීමේ කර්මාන්තයයි. 1980 දී අපනයනය කරන ලද මැණික් වල නෑ.වි.ස. වටිනාකම රුපියල් දශ ලක්ෂ 458·1 ක් වන අතර මෙය පෙර වසරේ අපනයනය කරන ලද මැණික් වල වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 490·1 ට වඩා අඩුවූවකි. 1980 දී රාජ්‍ය මැණික් සංස්ථාවේ මැණික් වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 663·8 ක් විය. කැනීම් කටයුතු වල සිදු වූ අඩු මට්ටමේ වර්ධනය, ගඩොල්, වැලි, උළු ආදිය සඳහා වූ ඉල්ලුම අඩු වීමටද බල පා ඇත. මේ අනුව 1979 වසර හා සසඳා බලන කල මෙම අංශයේ ක්‍රියාකාරිත්වයෙහි පහළ බැසීමක් පෙන්නුම් කරයි.

කැනීම් කටයුතු අංශයේ නිමැවුම 1980 දී සියයට 11 කින් වැඩි විය. මෙම අංශයේ ඉතා විශාල වර්ධනයක් පසුගිය දෙවසර තුළදී දක්නට ලැබුණි. මේ අනුව බලන විට 1978 හා 1979 යන වර්ෂයන්ට සාපේක්ෂව 1980 දී කැනීම් කටයුතුවල තරමක අඩුවීමක් දක්නට ලැබේ. පසුගිය වර්ෂවල පැවති කැනීම් කටයුතුවල වර්ධනය නිසා නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි සඳහා තිබූ දැඩි ඉල්ලුම තරමක්දුරට සපුරාලන්ට ඇතැයි කිව හැක. මෙම වර්ෂයේදී ඉදි කිරීම් වියදම්හි අධික වැඩි වීම හා තාවකාලිකව පැවති සිමෙන්ති හිඟය කැනීම් කටයුතු අංශය කෙරෙහි අයහපත් අයුරින් බලපා ඇත. සිමෙන්ති කිලෝ ග්‍රෑම් 50 ක සාමාන්‍ය මිල 1979 දී රුපියල් 45 ක් වූ අතර 1980 දී එය රුපියල් 70 දක්වා වැඩිවී තිබුණි. අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍යයන්ගේ මිලද සැළකිය යුතු අන්දමින් පසුගිය වසර තුළදී වැඩි වී ඇත. ඉදි කිරීම් කටයුතු වලදී මධ්‍යම ප්‍රමාණයේ නිවසක් තැනීම සඳහා වූ වියදම් සියයට 24 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. මීට අමතරව සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ 1980 දෙවන භාගයේදී සිදු වූ නිෂ්පාදන ඇනහිටීම් හේතුකොට ගෙන සිමෙන්ති ලබා ගැනීමද අසීරු විය. 1980 දී සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ සිමෙන්ති අලෙවිය සියයට 8 කින් අඩු විය. එය 1979 වසර හා සසඳා බලන කල ටොන් 6,08,000 සිට ටොන් 5,59,000 දක්වා අඩුවීමකි. කෙසේ වුවද ආනයන සිමෙන්ති ප්‍රමාණයන් ගණන් ගෙන බලන විට ලබාගත හැකි සිමෙන්ති ප්‍රමාණය 1979 වසරට වඩා සියයට 10 කින් වැඩි විය. කෙසේ හෝ මෙබඳු තත්වයක් දක්නට ලැබුණද

මුදල්මය වටිනාකම අනුව බලනවිට 1980 දී තැනීම් කටයුතුවල විශාල වර්ධනයක් පෙන්නුම් කරයි. තැනීම් කටයුතුවල මූලික වැඩි වීම් සිවිල් ඉංජිනේරු කටයුතුවල වන අතර එහිලා විශේෂයෙන් කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය සහ නේවාසික නොවන තැනීම් කටයුතු වැදගත් තැනක් ගනී. එමෙන්ම ජාතික නිවාස වැඩ සටහනද 1980 තැනීම් කටයුතු අංශයේ සැළකිය යුතු බලපෑමක් කළ කොටසකි.

සේවා අංශයේ උසස් මට්ටමේ ක්‍රියාකාරිත්වය තවදුරටත් 1980 වසර තුළදීද පැවතුණි. තොග සහ සිල්ලර වෙළඳාම් යන අංශයන් සියයට 8·4 කින් වර්ධනය වී ඇත. පසුගිය වර්ෂ දෙක තුළදී මෙන්ම මෙම වසරේදීත් මෙම අංශය තුළ පැවැති වර්ධනය එයාකාර යෙන් පවත්වා ගත්තේ ප්‍රධාන වශයෙන්ම ආනයන වැඩිවීම මගිනි. ඇත්තවශයෙන්ම පසුගිය කාලයෙහි මෙම අංශය තුළ පැවති එකී වර්ධනයේ ලක්ෂණය වූයේ එහි ක්‍රියාකාරිත්වයේ මට්ටම කෙරෙහි ආනයන ඉල්ලුම මගින් ඇති වූ බලපෑමේ ප්‍රතිවිපාකයයි. 1980 දී ප්‍රවාහන අංශයේ නිමැවුම සියයට 7·1 කින් වැඩිවී ඇත. පසුගිය වර්ෂ කීපය තුළ හා විශේෂයෙන්ම 1980 දී ප්‍රවාහණ උපකරණ සඳහා වූ ආයෝජනයෙහි ඉහල මට්ටමක් දැකිය හැකිය. මෝටර් රථවාහන කොමසාරිස්ගේ වාර්තාවලට අනුව 1980 වසර තුළදී ලියාපදිංචි කරන ලද ලොරි සංඛ්‍යාව 9,323 කින්ද, මගී ප්‍රවාහන වෑන් සහ සංචාරක බස් රථ ප්‍රමාණය 2,702 කින්ද වැඩි වී ඇත. පසුගිය වසර තුන තුළ වාහන සංඛ්‍යාවේ සිදු වූ විශාල වැඩිවීම ප්‍රවාහන අංශයේ තරඟකාරිත්වයෙහි වැඩිවීම පිළිබිඹු කරයි.

බැංකු කටයුතු හා අනෙකුත් මූල්‍ය සේවාවන්හි ව්‍යාප්ත වීම 1980 වසර තුළදීද නොකඩවා පැවතුනි. 1979 වසරේ සියයට 10 වර්ධනය හා සංසන්දනය කර බලනවිට මෙම අංශයන් 1980 දී සියයට 15 කින් වඩා සීඝ්‍ර ලෙස වර්ධනයවී ඇත.

අනෙකුත් සේවාවන්හි නිමැවුම, 1980 දී සියයට 8 කින් ඉහළ ගොස් ඇත. විශේෂයෙන් සංචාරක ව්‍යාපාරයේ වැදගත්කම වැඩිවීම හේතුකොටගෙන හෝටල් හා ආපන ශාලා සේවාවන්හි සහ පෞද්ගලික සේවාවන්හි සැළකිය යුතු වර්ධනයක් වාර්තා වී ඇත. පසුගිය වසර තුනෙහිම උසස් අන්දමින් වර්ධනයක් සිදු වූ සේවා අංශයේ ක්‍රියාකාරිත්වය තීව්‍ර කිරීමට, නිදහස් ආනයන ප්‍රතිපත්තිය සහ නිමැවුම් කර්මාන්ත හා තැනීම් කටයුතුවල උසස් මට්ටමේ ආයෝජනයන්ද වැදගත් අයුරින් බලපෑම් කර ඇත. මේ නිසා බොහෝ දුරට මෙම අංශයන්හි රැකියාවන් බහුල වීම දැකිය හැකිය.

1980 වර්ෂයේදී 1978 හා 1979 වර්ෂවලට වඩා ආර්ථිකයේ අංශීය ක්‍රියාකාරිත්වයේ යම් යම් වෙනස්කම් පෙන්නුම් කරයි (1·3 සංඛ්‍යා සටහන බලන්න). 1980 දී වැඩි වූ මූර්ත දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 14 ක්ම කෘෂිකාර්මික අංශයෙන් ඇති වූ අතර 1979 එය සියයට 8 ක් පමණ විය. දේශීය කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව දියුණු වූ අතර එහිලා විශේෂයෙන්ම වී නිෂ්පාදනය ගැන සඳහන් කළ යුතුය. තැනීම් කටයුතු හා නිමැවුම් කර්මාන්ත යන දෙඅංශයෙන්ම සිදු වූ දායකත්වය පහත බැස ඇත. නිමැවුම් කර්මාන්ත අංශයේ දායකත්වය පහළ බැසීමෙහි ලා වැවිලි භෝගයන්හි සැකසුම්වල මූර්ත එකතු කළ අගය අඩු වීම ඊට වගකිවයුතු ප්‍රධාන සාධකයක් ලෙස දැක්විය හැකිය. මේ අනුව 1980 වර්ෂයේ ආර්ථික වර්ධනයෙහි ප්‍රධාන මූලයන් වූයේ වෙළඳාම, ප්‍රවාහනය හා අනෙකුත් සේවා අංශයන්ය. 1980 දී දළ ජාතික නිෂ්පාදනය වැඩිවීමෙහි ලා වෙළඳාම හා ප්‍රවාහන යන අංශයන් සියයට 41 ක ප්‍රමාණයකින් දායකවී ඇත. මේවා 1978 දී හා 1979 දී දායක වූයේ පිළිවෙලින් සියයට 29 කින් හා සියයට 36 කිනි.

පසුගිය තෙවසර තුළ ආයෝජනයන්ගේ විශාල වැඩිවීමක් දක්නට ලැබුණි. එය විශේෂයෙන්ම නිමැවුම් කර්මාන්ත හා තැනීම් කටයුතු අංශවල ඇතිවුවද ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වැදගත් ව්‍යුහාත්මක වෙනසක් තවමත් දක්නට නැත. මෙහිදී විශේෂයෙන්ම නිම කළ කාර්මික භාණ්ඩවල වැදගත්කම වැඩි වීම, හෝ නිමැවුම් කර්මාන්ත හා තැනීම්

## 1 · 3 සංඛ්‍යා සටහන

### ස්ථාවර (1970) මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය 1978–1980*

| අංශය | එකතුකළ වටිනාකම (රු. දශ ලක්ෂ) | | | ද. ජා. නි. හි ප්‍රතිශතයක් වශයෙන් | | | පසුගිය වසරට වඩා වැඩිවීම (රු. දශ ලක්ෂ) | | | ද. ජා. නි. වැඩිවීමේ ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980 | 1978 | 1979 | 1980 | 1978 | 1979 | 1980 | 1978 | 1979 | 1981 |
| 1· කෘෂිකර්මය, දව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය .. | 4,532 | 4,622 | 4,766 | 26·2 | 25·1 | 24·6 | 233 | 90 | 144 | 17·8 | 8·4 | 14·2 |
| 1·1 කෘෂිකර්මය .. | 4,176 | 4,239 | 4,348 | 24·1 | 23 1 | 22·4 | 199 | 63 | 109 | 15·2 | 5·9 | 10·7 |
| 1·1·1 තේ .. | (398) | (412) | (381) | (2·3) | (2·2) | (2·0) | (– 18) | (14) | (–31) | (–1·4) | (1·3) | (–3·1) |
| 1·1·2 රබර් .. | (225) | (223) | (194) | (1·3) | (1·2) | (1·0) | (12) | (–2) | (–29) | (–0·9) | (–0·2) | (–2·9) |
| 1·1·3 පොල් .. | (488) | (519) | (462) | (2·8) | (2·8) | (2·4) | (65) | (31) | (–57) | (5·0) | (2·9) | (–5·6) |
| 1·1·4 වී .. | (1,116) | (1,132) | (1,267) | (6·4) | (6·2) | (6·5) | (126) | (16) | (135) | (9·6) | (1·5) | (13·3) |
| 1·1·5 අනෙකුත් .. | (1,949) | (1,953) | (2,044) | (11·3) | (10·6) | (10·5) | (14) | (4) | (91) | (1·1) | (0·5) | (9·0) |
| 1·2 දව ආදී වන ද්‍රව්‍ය .. | 155 | 166 | 181 | 0·9 | 0·9 | 0·9 | 12 | 11 | 15 | 0·9 | 1·0 | 1·5 |
| 1·3 ධීවර කර්මාන්තය .. | 201 | 217 | 237 | 1·2 | 1·1 | 1·2 | 22 | 16 | 20 | 1·7 | 1·5 | 2·0 |
| 2· පතල් හා කැනීම් කටයුතු .. | 619 | 652 | 684 | 3·6 | 3·5 | 3·5 | 100 | 37 | 32 | 7·6 | 3·4 | 3·1 |
| 3· නිමැවුම් කර්මාන්ත .. | 2,541 | 2,659 | 2,681 | 14·7 | 14·5 | 13·8 | 184 | 118 | 22 | 14·0 | 10·9 | 2·2 |
| 3·1 අපනයන සැකසීම් .. | 840 | 877 | 791 | 4·9 | 4·8 | 4·1 | 17 | 33 | – 86 | 1·3 | 3·4 | – 8·5 |
| 3·2 කර්මාන්ත නිෂ්පාදන .. | 1,362 | 1,417 | 1,488 | 7·9 | 7·7 | 7·7 | 135 | 55 | 71 | 10·3 | 5·1 | 7·0 |
| 3·3 කුඩා සහ අනෙකුත් කර්මාන්ත .. | 339 | 365 | 402 | 2·0 | 2·0 | 2·0 | 32 | 26 | 37 | 2·4 | 2·4 | 3·6 |
| 4· තැනීම් කටයුතු .. | 794 | 960 | 1,066 | 4·6 | 5·2 | 5·5 | 175 | 166 | 106 | 13·3 | 15·4 | 10·4 |
| 5· විදුලිය, ගෑස්, ජලය ආදිය . | 158 | 190 | 209 | 0·9 | 1·0 | 1·1 | 27 | 32 | 19 | 2·1 | 3·0 | 1·9 |
| 6· ප්‍රවාහණ, පණිවුඩ හුවමාරුව .. | 1,607 | 1,716 | 1,838 | 9·3 | 9·3 | 9·5 | 109 | 109 | 122 | 8·3 | 10·1 | 12·0 |
| 7· වෙළඳාම . | 3,267 | 3,551 | 3,849 | 18·9 | 19·3 | 19·8 | 268 | 284 | 298 | 20·4 | 26·3 | 29·3 |
| 7·1 ආනයන .. | 702 | 864 | 985 | 4·1 | 4·7 | 5·2 | 189 | 162 | 121 | 14·4 | 15·0 | 11·9 |
| 7·2 අපනයන .. | 701 | 709 | 709 | 4·1 | 5·9 | 3·7 | 38 | 8 | — | 2·9 | 0·7 | — |
| 7·3 දේශීය .. | 1,864 | 1,978 | 2,155 | 10·8 | 10·8 | 11·1 | 41 | 114 | 177 | 3·1 | 10·6 | 17·4 |
| 8· බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපල .. | 318 | 350 | 402 | 1·8 | 1·9 | 2·1 | 23 | 32 | 52 | 8·8 | 3·0 | 5 1 |
| 9· නිවාස අයිතිය .. | 499 | 518 | 549 | 2·9 | 2·8 | 2·8 | 24 | 19 | 31 | 1·8 | 1·8 | 3·1 |
| 10· රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂක කටයුතු .. | 854 | 905 | 959 | 4·9 | 4·9 | 4·9 | 63 | 51 | 54 | 4·8 | 4·7 | 5·3 |
| 11· සේවා (අන් තැනක සඳහන් නොවන) .. | 2,212 | 2,378 | 2,572 | 12·8 | 12·9 | 13·3 | 113 | 116 | 194 | 8·6 | 10·8 | 19·1 |
| 12· දළ දේශීය නිෂ්පාදිතය .. | 17,401 | 18,501 | 19,575 | 100·5 | 100·6 | 100·9 | 1,323 | 1,100 | 1,074 | 100·8 | 102·0 | 105·7 |
| 13· විදේශීය ශුද්ධ සාධක ආදයම .. | – 90 | – 112 | – 170 | – 0·5 | – 0·6 | – 0·9 | – 11 | – 22 | – 58 | – 0·8 | – 2·0 | – 5·7 |
| 14· දළ ජාතික නිෂ්පාදිතය .. | 17,211 | 18,389 | 19,405 | 100 0 | 100·0 | 100·0 | 1,312 | 1,078 | 1,016 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* තාවකාලික ඇස්තමේන්තු.

කටයුතු යන අංශයන්හි ආංශික වැදගත්කමෙහි දිගුකාලීන වෙනසක් හෝ වැනි දෙයක් සිදු වූ බවක් නොපෙනේ. (1·4 වන සංඛ්‍යා සටහන බලන්න) සේවා අංශයේ ආංශික වැදගත්කමේ වර්ධනය ආනයනවල විශාල වැඩි වීම නිසා පවත්වා ගැනීමට හැකි විය. එම තත්වය අඛණ්ඩව තබා ගැනීම, ආනයන වැඩි කිරීම හෝ පවතින තත්වය තවදුරටත් පවත්වා ගැනීම සඳහා ඇති හැකියාව මත හෝ රඳා පවතී. මෙය රඳා පවතිනුයේ ආර්ථිකයෙහි ආනයන ධාරිතාව මතය. ආනයන ධාරිතාව විශාල වශයෙන් අපනයන ඉපැයුම් මත රඳා පවතී.

ආර්ථිකය තුළ විදේශ වෙළෙඳාමෙහි ඇති වැදගත්කම හේතුකොටගෙන සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි වෙළෙඳ අනුපාතයේ බලපෑම වැදගත් තැනක් ගනී. ජාත්‍යන්තර මිළ ගණන්වල වෙනස්කම් මගින් 1980 දී ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි අයහපත් අයුරින් බලපෑම් ඇති කෙරිණි. රටේ වෙළෙඳ අනුපාතය තවදුරටත් සියයට 19 කින් පමණ පිරිහිණි. 1979 දී වෙළෙඳ අනුපාතය 68 ක් වූ අතර 1980 දී එය 55 දක්වා (1970=100) පහල බැස ඇත. එහි ප්‍රතිඵලය වශයෙන් මූර්ත ජාතික ආදයම, එනම් වෙළෙඳ අනුපාතයේ වෙනස්කම් සඳහා ගලපන ලද දළ ජාතික නිෂ්පාදිතය, සියයට 3·7 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. එය 1979 වසරේදී සියයට 3·1 කින් වැඩි වී තිබුණි. මූර්ත ජාතික ආදයම පිළිබඳ ඇස්තමේන්තු සංඛ්‍යාලේඛන පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

දළ ජාතික වියදම හා දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පිළිබඳ ඇස්තමේන්තු ද සංඛ්‍යා ලේඛන පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

1979 වසරට වඩා සියයට 42 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 1980 දී දළ දේශීය වියදම රුපියල් දශ ලක්ෂ 83,550 වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මෙය රුපියල් දශ ලක්ෂ 59,084 වූ පරිභෝජන වියදමෙන් හා රුපියල් දශලක්ෂ 24,466 වූ ප්‍රාග්ධන සම්පාදනය යන අංශ දෙකින් සමන්විත වෙයි. පරිභෝජන වියදමේ සංයුතිය, රුපියල් දශ ලක්ෂ 13,602 ක් වූ ආනයන වියදමෙන්ද, රුපියල් දශ ලක්ෂ 39,797 ක් වූ මෙරට නිපදවන ලද භාණ්ඩ සඳහා වූ වියදමෙන්ද, රුපියල් දශ ලක්ෂ 5,685 ක් වූ රජයේ පරිභෝජන වියදමෙන්ද යුක්ත වේ. ඒ අනුව වසර තුළදී ආනයන සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම සියයට 38 කින්ද, මෙරට නිපදවන ලද භාණ්ඩ සඳහා වූ වියදම සියයට 30 කින්ද ඉහළ ගොස් ඇත. එම වියදම් වල වැඩි වීම 1979 දී පිළිවෙළින් සියයට 29 ක් හා සියයට 25 ක් විය.

1980 දී දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය රුපියල් දශ ලක්ෂ 24,466 ක් වන අතර එය 1979 වසරට වඩා සියයට 81 ක වැඩිවීමකි. මෙම ප්‍රාග්ධන සම්පාදනයෙන් රුපියල් දශ ලක්ෂ 7,690 ක් රජය මගින්ද, රුපියල් දශ ලක්ෂ 16,776 ක් පෞද්ගලික අංශය හා රාජ්‍ය සංස්ථා වලින්ද වී ඇත.

1980 දී ආයෝජන භාණ්ඩ ආනයනයන් විශාල ප්‍රමාණයකින් වැඩි වී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ආනයන පරිමා දර්ශකයට අනුව ආයෝජන භාණ්ඩ ආනයන ප්‍රමාණය සියයට 19 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. වටිනාකම් අනුව මැන බලන කල දළ ජාතික ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙහි යන්ත්‍ර සහ උපකරණ ප්‍රමාණය සියයට 68 කින්ද, ප්‍රවාහණ උපකරණ සියයට 131 කින්ද වැඩි වී ඇතැයි ගණනය කර ඇත. මෙම එක් එක් අංශයන් යටතේ ආයෝජනයන් සැකසී ඇති අන්දම පිළිබඳ විස්තර සංඛ්‍යා ලේඛන පරිශිෂ්ඨයේ දක්වා ඇත. පසුගිය වසර තුන තුළ දී ආයෝජන භාණ්ඩ ආනයනයන්ගේ මූලික වැඩි වීම් පිළිබඳ විස්තර 1·4 වැනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරෙයි. ආයෝජන භාණ්ඩ ආනයනය විශාල ලෙස වැඩි වීම කෙරෙහි එක්වර ක්ෂය කිරීමේ පහසුකම ලබා ගත හැකි වීම වැදගත් අයුරින් බලපා ඇත. ආයෝජන භාණ්ඩ ආනයනය පිළිබඳ දත්ත වලින් නිමැවුම් කර්මාන්ත, ප්‍රවාහනය සහ තැනීම් කටයුතු යන අංශයන්හි විශාල වශයෙන් ප්‍රාග්ධන තොග වැඩි වීමක් සිදු වූ බව පෙන්නුම් කරයි.

## 1 · 4 සංඛ්‍යා සටහන

### තෝරාගත් ආනයනිත ආයෝජන භාණ්ඩ

වි. ර. ග. වටිනාකම රු. '000

| ශිර්ෂය | 1978 | 1979 | 1980 |
|---|---|---|---|
| 1. බස් සහ මගී ප්‍රවාහණ රථ .. | 29,231 | 412,054 | 421,207 |
| 2. ලොරි .. | 237,068 | 317,824 | 765,460 |
| 3. එන්ජිම සවිකරණ ලද වැගි .. | 407,482 | 282,538 | 235,296 |
| 4. ට්‍රැක්ටර් .. | 350,992 | 366,214 | 370,246 |
| 5. බුල්ඩෝසර් .. | 37,772 | 196,168 | 512,351 |
| 6. දුම්රිය ඇන්ජින් සහ අමතර කොටස් .. | 100,343 | 471,686 | 300,043 |
| 7. අහස්යානා සහ හෙලිකොප්ටර් .. | 47,721 | 33,221 | 3,725 |
| 8. මුහුදු යාත්‍රා එන්ජින් සහ පිටතින් සවිකරණ බෝට්ටු ඇන්ජින් .. | 63,486 | 78,208 | 107,334 |
| 9. නැව්, තෙල් නැව් සහ ට්‍රෝලර් .. | 8,094 | 5,218 | 6,721 |
| 10. විදුලි උත්පාදන යන්ත්‍ර .. | 45,979 | 15,030 | 117,457 |
| 11. ලියවන පට්ටල්, මිලිං පට්ටල්, විදින යන්ත්‍ර ආදිය .. | 20,949 | 39,079 | 91,659 |

මූලය: ශ්‍රී ලංකා රේගුව.

1980 දී තැනීම් කටයුතු අංශය තුළ ආයෝජනයන් ඉතා විශාල ලෙස වැඩි වී ඇත. එකී ආයෝජනයන්ගෙන් සැහෙන කොටසක් රාජ්‍ය අංශය හා සම්බන්ධිතය. මෙම වසර තුලදී කඩිනම් මහවැලි ව්‍යාපාරය සඳහා වූ වියදම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,000 ට වඩා වැඩි වූ අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වියදම් රුපියල් දශ ලක්ෂ 1,000 ක් ඉක්මවිය. පසුගිය දෙවසර තුළ මෙන්ම මෙම වසරේදීද ඉංජිනේරු තැනීම් කටයුතු අංශයේ ආයෝජනයන් ඉහළ මට්ටමකින් සිදු වී ඇත.

## 1 · 5 සංඛ්‍යා සටහන

### ප්‍රාග්ධන වියදමෙහි ආනයනිත ප්‍රමාණය

රු. දශ ලක්ෂ

| ශිර්ෂය | 1978 | 1979 | 1980 |
|---|---|---|---|
| 1. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 8,521 | 13,246 | 22,846 |
| 2. ආනයනිත ආයෝජන භාණ්ඩ (මි. ර. ග. වටිනාකම) .. | 3,217 | 5,091 | 7,531 |
| 3. ආනයනිත ප්‍රමාණය .. | 37·8 | 38·4 | 33·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව.

1978 සිට 1980 දක්වා වූ පසුගිය තෙවසර තුළ වූ ප්‍රාග්ධන වියදමෙන් තුනෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයක් ආයෝජන භාණ්ඩ ආනායනයන්ගෙන් සමන්විත විය. 1980 දී ආයෝජනවල ආනයන අනුපාතය තුනෙන් එකකට පමණ අඩු වී ඇත.

**සම්පත් හා සම්පත් උපයෝජනය**

දළ දේශීය නිෂ්පාදිතය සහ ආනයන යන අංශ වලින් සමන්විත වන ශ්‍රී ලංකා ආර්ථිකයෙහි මුළු සම්පත් ප්‍රමාණය 1980 දී රුපියල් දශ ලක්ෂ 105,866 ක් විය. මෙය 1979 වසරට වඩා සියයට 38 ක වැඩිවීමකි. මූර්ත වශයෙන් මැන බලන කල මුළු සම්පත් ප්‍රමාණය සියයට 8·3 කින් වැඩි වී ඇති අතර 1979 දී එය සියයට 10·7 කින් වැඩි වී තිබුණි.

## 1 · 6 සංඛ්‍යා සටහන

### සම්පත් සංයුතිය සහ උපයෝගී කරගත් ආකාරය 1978—1980*

| වර්ගය | වර්තන වෙළෙඳ මිල (රු. දශ ලක්ෂ) අනුව | | | 1978 මිල අනුව | | | | | | ප්‍රතිශතක වර්ධනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980 | 1978 | | 1979 | | 1980 | | 1978 ට වඩා 1979 | 1979 ට වඩා 1980 |
| | | | | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | | |
| 1. **මූළ සම්පත්** .. .. | **58,285** | **76,970** | **105,866** | **58,285** | **100** | **64,546** | **100** | **69,887** | **100** | **10·7** | **8·3** |
| 1·1 වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය .. .. | 42,428 | 52,147 | 68,271 | 42,428 | 73 | 45,058 | 70 | 47,671 | 67 | 6·2 | 5·8 |
| 1·2 භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයන .. .. | 15,857 | 24,823 | 37,595 | 15,857 | 27 | 19,488 | 30 | 22,216 | 33 | 23·0 | 14·0 |
| 2. **උපයෝගීකරණය** .. .. | **58,285** | **76,970** | **105,866** | **58,285** | **100** | **64,546** | **100** | **69,887** | **100** | **10·7** | **8·3** |
| 2·1 පරිභෝජනය .. .. | 36,148 | 45,169 | 59,084 | 36,148 | 62 | 39,410 | 61 | 42,070 | 59 | 9·0 | 6·7 |
| 2·2 ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය .. .. | 8,521 | 13,246 | 22,846 | 8,521 | 15 | 10,153 | 16 | 12,268 | 19 | 19·2 | 20·8 |
| 2·2·1 රජය .. .. | (3,077) | (3,809) | (6,710) | (3,077) | (5) | (3,569) | (6) | (4,104) | (6) | (16) | (15·0) |
| 2·2·2 රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල .. | (2,056) | (9,437) | (16,136) | (2,056) | (4) | (6,584) | (10) | (8,164) | (13) | (20·9) | (24·0) |
| 2·2·3 පුද්ගලික අංශය .. | (3,388) | | | (3,388) | (6) | | | | | | |
| 2·3 භාණ්ඩ තොග .. .. | +33 | +281 | +1,620 | +33 | — | 124 | — | 566 | 1 | — | — |
| 2·4 භාණ්ඩ සහ සාධක නොවන සේවා අපනයන .. .. | 13,583 | 18,274 | 22,316 | 13,583 | 23 | 14,983 | 23 | 14,983 | 21 | 10·3 | — |

* තාවකාලික ඇස්තමේන්තු.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සම්පත්වල සුළු වැඩිවීම තුළින් 1980 දී වූ පහළ මට්ටමේ වර්ධන අනුපාතයත්, ආනයන පරිමාවේ අඩු වීමත් යන කරුණු දෙකම පිළිබිඹු වෙයි. මූර්ත වටිනාකම් අනුව සම්පත් බෙදී ගිය ආකාරය විමසා බලන කල සම්පත් වලින් සියයට 59 ක් පරිභෝජනය සඳහාද, සියයට 19 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහාද සියයට 21 ක් අපනයන සඳහා වෙන් වී ඇතිබව පෙනේ. 1979 වසරේදී සම්පත් ප්‍රමාණයෙන් සියයට 61 පරිභෝජනය සඳහාත් සියයට 16 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහාත් වියදම් වී ඇත. ඒ අනුව බලන කළ මෙම වසරේදී පරිභෝජනයේ සිට ප්‍රාග්ධන සම්පාදනය කරා සම්පත්හි මාරුවීමක් දක්නට තිබේ.

මූර්ත වශයෙන් බලන කල පරිභෝජනය සියයට 6·7 කින් හා ප්‍රාග්ධන සම්පාදනය සියයට 25 කින් වැඩි වී තිබේ. එය 1979 දී පිළිවෙලින් සියයට 9 කින් හා සියයට 20 කින් වැඩි වී තිබුණි. 1980 අපනයන පරිමාව 1979 වසරේ මට්ටමෙන්ම පැවතුණි. ඒ අනුව පසුගිය වසරයන්හි පැවති උපනතිය නොකඩවාම සිදුවිය. 1979 දී මූර්ත අපනයන කොටසෙහි වැඩිවීම මඳ වශයෙන් විය.

1 · 7 සංඛ්‍යා සටහන

ඉතුරුම්

රු. දශලක්ෂ

| ශීර්ෂ | 1978* | 1979* | 1980* |
|---|---|---|---|
| 1. වෙළඳ මිළ අනුව දළ ජාතික නිෂ්පාදනය .. | 42,428 | 52,147 | 68,271 |
| 2. විදේශ සම්පත් (භාණ්ඩ හා සාධක නොවන සේවාවන්හි ශුද්ධ ආනයනය) .. | 2,274 | 6,549 | 15,279 |
| 3. ආයෝජන .. | 8,554 | 13,527 | 24,466 |
| 4. ඉතුරුම් (3 – 2) . | 6,280 | 6,978 | 9,187 |
| 5. ඉතිරි කිරීම් අනුපාතය (4 එකෙහි ප්‍රතිශතයක් ලෙස) .. | 14·8 | 13·4 | 13·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* තාවකාලික ඇස්තමේන්තු.

පවත්නා ඇස්තමේන්තු අනුව රටේ ඉතුරුම් ප්‍රමාණය මේ වසරේදී රුපියල් දශ ලක්ෂ 9,187 ක් වෙයි. එය 1979 ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 6,978 හා සසඳා බලන කල සියසට 32 ක වැඩිවීමකි. කෙසේ වුවද දළ ජාතික නිෂ්පාදිතයෙහි ඉතුරුම් අනුපාතය 1979 පැවති මට්ටමටම කිට්ටු සියයට 13·5 ක් වේ. මෙයින් පැහැදිලි වන්නේ රටේ උද්ධමනකාරී පීඩනයක් පැවතුනද ඉතුරුම් අනුපාතයෙහි අඩුවීමක් සිදු වී නැති බවය.

## කෘෂිකර්මය

වී වගා අංශය සම්බන්ධයෙන් හැර, 1980 වර්ෂය තුළදී කෘෂි අංශයේ ක්‍රියාකාරීත්වය නැවත වරක්, බලාපොරොත්තු වූවාට වඩා පහළ මට්ටමක විය. 1980 දී කෘෂිකාර්මික නිෂ්පාදනයේ වර්ධන අනුපාතය 1979 දී 2 ක් වූ වර්ධන අනුපාතයට වඩා සුළු වශයෙන් වැඩිව 2·9 ක් විය. 1978 සහ 1977 වර්ෂයන්හි අදළ වර්ධන අනුපාතයන් පිළිවෙලින් සියයට 4 ක් සහ සියයට 7 ක් විය. 1979 සහ 1980 වර්ධන අනුපාතයන් ජනගහණයේ වැඩි වීම සමඟ ගැලපුවහොත්, ලැබෙන ඒක පුද්ගල වර්ධන අනුපාතය ඇත්තවශයෙන්ම බලාපොරොත්තු කඩ කරවන සුළුය. ප්‍රධාන වැවිලි භෝග අංශයේ නිෂ්පාදනයේ පහත වැටීම නිසා අපනයන සඳහා ඇති අතිරික්තයන් අඩු විය. 1980 දී තේ නිෂ්පාදනය සියයට